ලංකා ධීවර සංස්ථාව - 2020

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා ධීවර සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ.කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගනන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි ඡේද 25 සහ 26 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අස්ථිත්වයට අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කළමනාකරණය විසින් සිදු කළ යුතු වුව ද සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල අඛණ්ඩව ශුද්ධ අලාභයන්, මුදල් හා මුදල් වලට සමාන දැනි ශුද්ධ වෙනස සෘණ අගයක් ගැනීම, වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ රු. මිලියන 1 050 ක් පැවතීම සහ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ අගයෙහි රු. මිලියන 18 ක අක්‍රීය ශේෂයක් පැවතීම අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පැවතීමේ ප්‍රමාණාත්මක සැක පහළ කරන සිද්ධීන් සහ තත්ත්වයන් පැවතිය ද මූල්‍ය ප්‍රකාශන තුළින් එවැනි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් වූ තක්සේරුවක් සිදුකර හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.	ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳව ගැටළුවක් දැනට පැන නැගී නොමැති අතර මේ සම්බන්ධ තොරතුරු ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 17 (ඇ) , (ඈ) ඡේද ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලබාගත් රු.245,000,000 ක ණය සහ රු.60,000,000 ක ණය ආපසු ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වෙන වෙනම හෙළිදරව් කිරීමකින් තොරව එහි ශුද්ධ බලපෑම වන රු.185,000,000 ක් මුදල් ප්‍රවාහය තුල හඳුනාගැනීමට කටයුතු කර තිබුණි.	විගණකවරුන් සඳහන් කර ඇති පරිදි ඉදිරි ගිණුම් පිලියෙල කිරීමේදී මූල්‍ය ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වන මුදල් හා මූල්‍යකරණ මුදල් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වෙන වෙනම හඳුනාගෙන ඉදිරිපත් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් දිනට සමාලෝචනය කළ යුතු වුවත්, තවදුරටත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.154,139,500 ක් වූ සහ ධාරණ අගය ශූන්‍ය වූ මෝටර් රථ සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුල සලසා නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ගැලපීමට කළමනාකරණය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් දිනට සමාලෝචනය කළ යුතුවේ.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි ඡේද අංක 74 (අ) ප්‍රකාරව ඇප තැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කළ යුතු වුවත්, 2013 සිට 2014 වර්ෂය දක්වා සංස්ථාව විසින් ලබාගෙන තිබුණු රු.75,000,000 ක බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඇප ලෙස තැබූ වත්කම් සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.	බැංකු අයිරා සහ ණය පහසුකම් ලබා ගැනීමට වෙනුවෙන් වූ ඇප ලෙස තැබූ වත්කම් සම්බන්ධයෙන් ලංකා බැංකු වෙතින් යොමුකරන ලද ලිපිය මේ සමඟ ඉදිරිපත් කරමි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඇප තැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කළ යුතු වේ.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද 63 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද 9 අනුව අක්‍රිය තත්ත්වයේ පවතින රු.252,352,500 වූ ශීතාගාර සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කලයුතු ගැලපීම් කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වේ.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද 74 (ආ) ප්‍රකාරව 2017 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.28,130,402 ක් වූ කෙරිගෙන යන වැඩ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත උපකරණ යටතේ ගිණුම් ගත කර තිබීම නිසා එම වටිනාකමින් දේපළ පිරියත හා උපකරණ අධිගණනය වී තිබුණි.	මාළු සැකසුම් කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට පටන්ගෙන ඇති නමුත් වර්තමානයෙහි එහි ඉදිරි වැඩ කටයුතු අතහැර දමා ඇත. මේ සම්බන්ධව අවශ්‍ය ගිණුම්කරණ ගැලපුම් ඉදිරි වර්ෂයේ සිදුකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කෙරිගෙන යන වැඩ ගිණුම්ගත කළ යුතු වේ.
(උ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද 9 ට පටහැනිව ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති 2003 වර්ෂයේ රුසියානු සමාගමක් සමඟ ඇති කරගත් රු.110,000,000ක් වූ බද්ධ ආයෝජනය වර්තමානයේ අක්‍රිය තත්ත්වයේ පවතින නමුත් ඒ සම්බන්ධයෙන් තක්සේරුවක් කර අදාල වෙන් කිරීම් සිදු කර නොතිබුණි.	බද්ධ ව්‍යාපාරයන් සඳහා ආයතනය විසින් පැවරූ දේපල යලි අත්පත් කර ගැනීමට අධිකරණමය ක්‍රියාමාර්ගයකට එලැඹ ඇති අතර ඒ සම්බන්ධ අවශ්‍ය ගිණුම්කරණ ගැලපුම් ඉදිරි ගිණුම් වර්ෂයේ සිදුකර	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව අදාල ආයෝජනය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කළ යුතු වේ.

		ප්‍රමාණවත් පරිදි ගිණුම්වල හෙලිදරව් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	
(ඌ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 08 හි ඡේද අංක 21, 22, 23 හා 24 ප්‍රකාරව ව්‍යාපාරයක වාර්තා කරන ලද උපප කොටස්හි ආදායම්ද වියදම්ද ඇතුළුව ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද සංස්ථාවේ විධායක ද ඇතුලත්ව අංශ 56 ක ලාභාලාභ වෙනම හෙලිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.	ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී සංස්ථාවේ විධායකයන් වල හා අනෙකුත් අංශවල ලාභාලාභ වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(එ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත 9 හි 5.1.1 ප්‍රකාරව අස්ථිත්වයක් මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට මැනිය යුතු අතර තවදුරටත් සහනදායී පොලී අනුපාත යටතේ ණය ලබා දෙන විට, ණයෙහි සාධාරණ වටිනාකම සහ එහි නාමික මුදල අතර වෙනස සේවක ප්‍රතිලාභයක් ලෙස සලකා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව ගිණුම් තුල හඳුනා ගැනීම සිදු කල යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.4,443,883 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන අනුව ආපදා ණය ශේෂය රු.4,443,883 ක් වුවද ණය ශේෂ සාරාංශ ලේඛනය අනුව එම ශේෂය රු.3,619,439 ක් වූයෙන් රු.824,443 ක වෙනසක් විය.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 5.1.1 පරිදි අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් ඉදිරි ගිණුම්වලට සිදු කිරීමට ද සහනදායී පොළී අනුපාතය ලෙස ලබා දෙන සේවක ණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කළමනාකරණය තීරණය කර ඇත. තව ද ආපදා ණය ශේෂයේ පවතින විෂමතාවයන් ඉදිරි ගිණුම් වලට ගැලපීමට කළමනාකරණය කර ඇත.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට මැනිය යුතු අතර, ආපදා ණය ශේෂයේ හි ඇති වෙනසට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වේ.

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සංස්ථාව සතු වෙනත් පාර්ශවයන්ට බදු දී ඇති ආයෝජිත දේපළ සෑම වසර පහකට වරක්ම සුදුසුකම්ලත් තක්සේරු කරුවෙකු හරහා තක්සේරුවක් සිදුකර ගත යුතු වුවද රු.69,374,150 ක ආයෝජන දේපළ සඳහා 2013 වර්ෂයෙන් පසුව තක්සේරුවක් සිදුකර ගිණුම්ගතකර නොතිබුණි.	ආයතනය මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම කටයුත්ත අතපසු වී ඇත. කෙසේ නමුත් ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී විගණන උපදෙස් අනුව කටයුතු කර නිවැරදි කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් පොලී ගෙවීම් රු.8,674,215 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පොලී ගෙවීම් රු.7,454,050 වූයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.1,220,165 කින් වැඩි වී තිබුණි.	2020 වර්ෂයේ අවසන් ගිණුම්වල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල පොළිය ගෙවීම් ලෙස පෙන්වා ඇති රු.7,454,050ක වටිනාකම සැකසී ඇත්තේ මූල්‍ය ආදායම වූ රු.1,220,165න් මූල්‍ය වියදම වූ රු.8,674,215ක අගය ගැලපීමෙන් පසු ඇතිවන ශුද්ධ වටිනාකමයි. ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පොළි වියදම් වෙන වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු සකස් කර ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ.
(ආ)	මීගමුව විධායකය විසින් සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම රු.10,000,000 ක් සහ ස්ථාවර තැන්පතු ඉවත් කර ගැනීම් රු.11,147,828 ක් වුව ද මෙම ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වෙන වෙනම හඳුනා ගැනීමකින් තොරව, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම් ලෙස රු.167,260 ක් පමණක් හඳුනාගෙන තිබුණි.	ලෙජර ගිණුම්වල ශුද්ධ බලපෑම දක්වා ඇති අතර ඉදිරි ගිණුම් වර්ෂවල ගිණුම් පිළියෙල කිරීමේදී විගණනයේ සඳහන් පරිදි ගිණුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරමි.	මුදල් ප්‍රවාහය ප්‍රකාශනය තුල ආයෝජනය ක්‍රියාකාරකම් වල සිදු වූ ගනුදෙනු වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වේ.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණු පාරිතෝෂික මුදල රු.1,000,246 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම ප්‍රමාණය රු.6,391,220 ක් වූයෙන් රු.5,390,974 කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අඩුවෙන් දැක්වුණි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඇතිවී ඇති දෝෂ ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පාරිතෝෂික මුදල් ගෙවීම් ලෙස මුදල් ගලා යෑම් නිවැරදිව හඳුනාගත යුතු වේ.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල මසුන් අලෙවි කිරීමේ වෙළඳ කුටි ඉදිකිරීම් සඳහා රු.8,228,071 ක් ගෙවා තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් ලෙස රු.2,472,324 ක් හඳුනාගෙන තිබුණි.	ඉදිරි ගිණුම් වර්ෂවලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදි ගැලපීම් සිදුකිරීමටත් එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීමටත් කටයුතු කරමි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයය තුල වෙළඳ කුටි ඉදිකිරීම් සඳහා වූ වියදම් ලෙස ගෙවූ මුදල්, නිවැරදිව හඳුනා ගත යුතු වේ.
(ඉ)	රු.2,558,029 ක් වූ ඇසුරුම් තොග ඌණතාවය ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ම අඩුවෙන් සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.	මෙම ඇසුරුම් තොග ඌණතාවය තොගය තුලින් ඉවත් කර ගිණුම්වලට ගැලපීමට කළමනාකරණය තීරණය කර ඇති අතර ඉදිරි	වසර කිහිපයක සිට ඉදිරියට එනු ලබන ඇසුරුම් තොග ඌනතාවය නිවැරදිව ගිණුම්ගත කළ යුතු

		ගිණුම් පිලියෙල කිරීමේදී මෙම ඌණතාවය නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කරන්නෙමු.	වේ.
(ඊ)	විධායකයන්හි ගිණුම් අතර සිදුවන ගනුදෙනු වලින් පැන නැගුණු ගණුදෙනු කාලපරිච්ඡේදයේ අවසානයට ශූන්‍ය විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ නිරවුල් කිරීමකින් තොරව රු.21,842,521 ක් වූ එම ශේෂය නොසැසඳුණු ශේෂයක් ලෙස ණයගැති ශේෂය තුල ඇතුළත් කර තිබුණි.	විධායකයන් අතර සිදුවන ගනුදෙනු සම්බන්ධව නොවිසඳුනු ගැටළු තත්වයන් මත මෙම ශේෂය ඉතිරි වී ඇති අතර දැනටමත් විධායක ජංගම ගිණුම් පරීක්ෂා කරමින් ගිණුම්කරණ ගැලපීම් කිරීමට කටයුතු කරමින් සිටී.	වසර කිහිපයක සිට පැවත එන නොසැසඳුනු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(උ)	රෝහල් විසින් ඇණවුම් කල මාළු වර්ග වෙනුවට ආදේශක මාළු ලබාදීම හේතුවෙන් රෝහල් 25 කින් ලැබිය යුතු රු.1,425,222 ක් වූ වසර 10 කට වඩා පැරණි ශේෂයන් අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පැවතියද හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි.	මෙම ශේෂය අයකර ගැනීම සඳහා ලිපි රෝහල් වෙත ඉදිරිපත් කර ඇති නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර ඇත. මෙම ශේෂය වයස් විශ්ලේෂණය අනුව අවුරුදු 10ට වැඩි ශේෂයන් වේ.	රෝහල් 25 න් ලැබිය යුතු යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීමටත් ඒ සඳහා හානිකරණ අලාභ සඳහා ගැලපීම් කිරීමටත් පියවර ගත යුතු වේ.
(ඌ)	වසර ගණනාවක සිට ඉදිරියට එන රු.34,945,139 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර තිබුණද මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණකවරුන් සඳහන් කර ඇති කරුණට අනුව අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු සකස් කර ඇති අතර ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේදී මෙම ගැලපීම් කිරීමට කළමනාකරණය තීරණය කර ඇත.	අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම	අනුරූපී වාර්තා අනුව වටිනාකම	වෙනස	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
		රු.	රු.	රු.		
(අ)	වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂය	280,803,912	258,457,012	22,346,900	පුරාණවැල්ල , වෙන්නප්පුව , කරවල ව්‍යාපෘතිය යන අංශ මේ වන විට දිගුකාලයක් වසා දමා ඇති බැවින් අදාල තොරතුරු සොයා ගැනීමට නොහැකි තත්වයක් ඇති අතර, ඉදිරියේදී මෙම	ඉදිරියේදී මෙම තොරතුරු සොයා බලා ශේෂයන් තුලනය කිරීමට කටයුතු කළ යුතු වේ.

					තොරතුරු සොයා බලා ශේෂයන් සැසඳුම් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	
(ආ)	වෙළඳ ගෙවිය යුතු ශේෂය	321,947,802	327,867,860	5,920,058	පුරාණවැල්ල , වෙන්නප්පුව , කරවල ව්‍යාපෘතිය යන අංශ මේ වන විට අක්‍රීය තත්ත්වයේ ඇති බැවින් ලේජර් ශේෂයක් පමණක් පවතී. අදාල තොරතුරු සොයා ගැනීමට නොහැකි තත්වයක් ඇති අතර, ඉදිරියේදී මෙම තොරතුරු සොයා බලා ශේෂයන් සැසඳුම් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	ඉදිරියේදී මෙම තොරතුරු සොයා බලා ශේෂයන් තුලනය කිරීමට කටයුතු කළ යුතු වේ.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අනෙකුත් වෙළඳ ලැබිය යුතු දෑ	66,304,514	ණයගැති කාල විශ්ලේෂණය	විගණකවරුන් දක්වා ඇති පරිදි බොහෝ පැරණි සමහර ගිණුම් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් හා ප්‍රවීණ විගණන සාක්ෂි ආයතනය සතුව නොමැති අතර තවදුරටත් සඳහන් කර ඇති සමහර කරුණු සඳහා දැනටමත් පවතින විගණන සාක්ෂි ලබා දී ඇත. ඉතිරි ගිණුම් සඳහාද දැනට පවතින විගණන සාක්ෂි ලබා දිය යුතු වේ.	ශේෂ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ.
(ii)	විවිධ ණයගැතියන්	8,401,785	විස්තරාත්මක උපලේඛන		
(iii)	ලැබිය යුතු දෑ තුළ ඇතුළත් අක්‍රිය ණය ශේෂය	17,652,663	උපලේඛන, වයස් විශ්ලේෂණ හා , ශේෂයන් අක්‍රිය වීමට හේතු		
(iv)	වෙළඳ ලැබිය යුතු දෑ	223,563,341	ශේෂ සනාථනයන්		
(v)	වෙළඳ ගෙවිය යුතු දෑ - අක්‍රිය ණය ශේෂය	22,888,294	විස්තරාත්මක උපලේඛන		
(vi)	වෙළඳ ගෙවිය යුතු දෑ	237,931,473	ශේෂ සනාථනයන් හා කාල විශ්ලේෂණය		
(vii)	විවිධ ණයහිමියන්	47,812,579			

(viii)	සේවක ආරක්ෂිත තැන්පතු	13,173,166	විස්තරාත්මක උපලේඛනයක්	විගණකවරුන් දක්වා ඇති පරිදි බොහෝ පැරණි සමහර ගිණුම් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් හා ප්‍රවීණ විගණන සාක්ෂි ආයතනය සතුව නොමැති අතර තවදුරටත් සඳහන් කර ඇති සමහර කරුණු සඳහා දැනටමත් පවතින විගණන සාක්ෂි ලබා දී ඇත. ඉතිරි ගිණුම් සඳහාද දැනට පවතින විගණන සාක්ෂි ලබා දිය යුතු වේ.	ශේෂ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ.
(ix)	කලින් ගෙවන ලද වෙනත් තැන්පතු	11,925,206			
(x)	ණය සහ ණය ගෙවීම	142,922,000			
(xi)	ආපසු ගෙවිය යුතු වෙනත් තැන්පතු	27,566,035	විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ		
(xii)	ණය හිමියෝ	26,555,149	විස්තරාත්මක උපලේඛන ,ශේෂ සනාථ කිරීම් අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි, වයස් විශ්ලේෂණ		
(xiii)	විවිධ ආදායම්	3,189,252	විස්තරාත්මක උපලේඛන		
(xiv)	වෙනත් දීමනා	5,571,019			
(xv)	ස්ථාවර තැන්පතු	10,200,000	තැන්පතු සහතික, තැන්පතු අලුත් කිරීමේ නිවේදන සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන්		
(xvi)	බැංකු ජංගම ගිණුම් 9 ක අයිරාශේෂය	1,015,670	ශේෂ සනාථනයන්		
	බැංකු ගිණුම් 19 කට අදාළවන වාසිදායක ශේෂයක්	44,253,164			
(xvii)	බැංකු අයිරාව	48,528,540	අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය		
(xviii)	ජංගම නොවන වත්කම්	499,045,595	වත්කම් සමීක්ෂණ වාර්තා		

(xix)	සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල.	9,939,536	ගිවිසුම් සහ කාල විශ්ලේෂණයක්

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රු.258,457,012 ක් වූ වෙළඳ සහ අනෙකුත් වෙළඳ ලැබිය යුතු ශේෂවලින් වර්ෂ 5 ත් 10ත් අතර ශේෂය රු.65,710,850 ක්ද වර්ෂ 10 කට වැඩි ශේෂය රු.17,686,140 ක් ද විය.	අවුරුදු 05 හා 10වැඩි ණයගැනි ශේෂයන් සම්බන්ධ තීරණයක් ගැනීම සඳහා 2017 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් ඉල්ලුම් කර ද ඒ සඳහා නිවැරදි විසඳුමක් නොලැබුනු අතර, ඉදිරියේදී මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	වෙළඳ සහ අනෙකුත් වෙළඳ ලැබිය යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතු වේ.
(ආ)	2015 වර්ෂයට සිට පැවත එනු ලබන රු.502,000 ක චෙක්පත් වංචාවක්, ලැබිය යුතු ශේෂය ලෙස ගිණුම්ගත කර තිබූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉතා පැරණි මෙම චෙක්පත් වංචාවට අදාල ශේෂය පිලිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය තීරණය කර ඇත.	චෙක්පත් වංචාවට අදාල ශේෂය පිලිබඳව සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කළ යුතු වේ.
(ඇ)	මාළු සැපයීමෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් අයවිය යුතු රු.5,367,000 ක ශේෂය අය කර ගැනීමට වාර්තාවේ දින වන විටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ගොන්ඩොලා ලෙස රඳවාගෙන ඇති මුදල ලබා දෙන ලෙස කිහිප වරක් ලිඛිතව ඉල්ලුම් කර ඇති නමුත් සතොස ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාල මුදල ගෙවීම් නොකරන බවත් පොත් වලින් කපා ඉවත් කරන ලෙසත් 2017 සැප්තැම්බර් 25 දිනැති ලිපිය මඟින් ලංකා සතොස ලිමිටඩ්හි සභාපතිතුමාගේ අත්සන සහිත ලිපියක් මඟින් දක්වා ඇත.	මෙම ණය ශේෂය සම්බන්ධයෙන් වූ ගිවිසුම් පරීක්ෂා කර අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකළ යුතු වේ.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රු. 172,852,137 ක් වූ වෙළඳ ගෙවිය යුතු ශේෂයෙන් වර්ෂ 1 ට වැඩි 2 අඩු ශේෂය රු.99,523,305 ක් වූ අතර වර්ෂ 2 ඉක්ම වූ ශේෂය රු.73,328,832 ක් විය.	වයස් විශ්ලේෂණ වාර්තාවට අනුව අවුරුදු 01ට වැඩි 02ට අඩු හා අවුරුදු 2ට වැඩි විශාල ශේෂයන් පවතින හා විධායක	වෙළඳ ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.

		කිහිපයක් වසා ඇති අතර එම විධායකයන්හි කිසිදු ගෙවීමක් සිදු නොවන බැවින් ලංකා ධීවර සංස්ථාව තුල පවතින අයහපත් මූල්‍ය තත්වය මත පැරණි ශේෂයන් ගෙවීමට නොහැකි වී ඇත.	

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ			
371 (5) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 9 වගන්තිය	නිලධාරීන් සඳහා ලබා දෙන අතුරු අග්‍රිමය කාර්යය අවසන් වූ දින සිට දින 10 ක් තුළදී පියවිය යුතු වුවද සංස්ථා නිලධාරීන් 108 වෙත ලබා දී ඇති එකතුව රු.1,102,060 ක අතුරු අග්‍රිමයන් දින 1 සිට දින 271 දක්වා ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි.	2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය තුල ලංකා ධීවර සංස්ථාවේ සේවකයින් නියමිත පරිදි රාජකාරියට වාර්තා නොකරන ලදී. එම කාලසීමාවේ (නිලධාරීන් 108 දෙනා) ලබාගත් අග්‍රිමයන් වෙනුවෙන් අත්තිකාරම් පියවීමද ප්‍රමාද විය.	චක්‍රලේඛය ප්‍රකාරව අතුරු අග්‍රිමයන් නියමිත කාල සීමාව ඇතුළත පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ.
(ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 16 (2) වගන්තිය	බැංකුව අයිරා පහසුකම් ලබා ගැනීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද එලෙස විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින විට රු.48,528,540 බැංකු අයිරා පහසුකම් සංස්ථාව විසින් ලබාගෙන තිබුණි.	ඉදිරියේදී බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණය තීරණය කර ඇත.	මුදල් පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(ඇ)1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ (5) (1) උපවගන්තිය	පාරිතෝෂික අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත් වීමෙදී දින 30ක් ඇතුළත එකී හිමිකම් ලබන පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද සංස්ථාව ඒ අනුව ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය රු.13,315,779 වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ අධිභාරය 1,988,869 ක් ද 2020 වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු මුළු අධිභාරය රු.3,188,430 විය. තව	ලංකා ධීවර සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් පාරිතෝෂික මුදල් ශේෂයක් පැවතුන අතර ඉදිරියේදී මූල්‍ය තත්වය යහපත් වීමට හැකියාවක් පවතින බැවින් ඉතා ඉක්මනින් මෙම ගෙවීම් අවසන් කිරීමට කටයුතු සිදුකරමින් පවතී.	පාරිතෝෂිත මුදල් ගෙවීම් පනත අනුව කටයුතු කළ යුතු අතර ගෙවිය යුතු පාරිතෝෂිත මුදල් ගෙවීමට කටයුතු කළ යුතු වේ.

	දුරටත් 2025 අප්‍රේල් 30 දිනට ගෙවීමට ඇති පාරිතෝෂික හා අධිභාරවල ශේෂය රු.22,183,769 ක් විය.		
(ඇ)2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ වගන්ති 18 (4)	අස්ථිත්වයක් විසින් විගණන ගාස්තු සඳහා වූ ගිණුම් ඉන්වොයිස් පත්‍රයේ දින සිට දින 30 ඇතුළත ගෙවා බේරුම් කළ යුතු නමුත් සංස්ථා විසින් 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.5,383,530 ක පැවතුණි.	විගණනයේ දක්වා ඇති කරුණු පිළිබඳ එකඟ වේ. වසර ගණනාවක සිට ආයතනයේ පැවති මූල්‍ය අර්බුදය හමුවේ විගණන ගාස්තු නියමිත කාලසීමාව තුල ගෙවීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මූල්‍ය තත්වය යහපත් වූ වහාම ගෙවීම් කිරීමට කටයුතු කරමි.	ජාතික විගණන පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(ඉ) 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය	ජාතිය ගොඩනැගීමේ බදු අදාල කාර්තුව අවසානයේ ඉක්බිතිව එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට 2015 සිට 2019 කාල සීමාවට අදාලව රු.95,519,939 ක ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ශේෂයක් විය.	බදු මුදල් නියමිත කාල වකවානුවලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට නොහැකි වීමට හේතු සාධක වූයේ ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතාවයයි. තවද 2024.12.31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමට ඇති මුදල රු.85,169,312.48 ක් වේ.	ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය අනුව ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඊ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 26 වන වගන්තිය	පනතට පටහැනිව 2002 සිට 2009 වර්ෂය දක්වා සහ 2015 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයන්ට අදාලව නොගෙවූ එකතු කළ අගය මත බදු බැදියාව රු 27,046,439 ක් විය.	ආයතනයේ පැවති මූල්‍ය අර්බුදය හමුවේ නියමිත කාල වකවානු වලදී එකතු කළ අගය මත බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට නොහැකි විය. එනමුත් 2020.12.31 දිනට නඩු කටයුතු අනුව පසුගිය වර්ෂ කිහිපයේ වරින් වර ගෙවීම් සිදු කිරීම මත 2024.12.31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට පවතින බදු වටිනාකම රු.21,519,043.00කි.	එකතු කළ අගය මත බදු පනතේ 26 වගන්තිය අනුව එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ.
(උ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	සේවායෝජකයා විසින් සෑම සේවකයකුගේ දායක මුදල ඒ සේවකයාගේ ඉපයීම්වලින් අඩුකොට ඊළඟ මාසයෙහි අවසාන දිනට පෙර අරමුදලට ගෙවිය යුතු නමුත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2020	ආයතනය දිගින් දිගටම මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතාවයන් නිසා EPF හා ETF මුදල් කලට වේලාවට ගෙවීමට නොහැකි විය. නමුත් පසුව මෙම හිඟ EPF හා ETF මුදල් වලින්	සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 පරිදි නිසි පරිදි කලට වේලාවට දායක මුදල් ප්‍රේෂණය කළ යුතු ව.

	දෙසැම්බර් 31 දිනට රු.353,045,586 ක් සහ රු.256,954 ක අධිභාර ගෙවීමට පැවතුණි.	කොටස් ගෙවීමට කටයුතු කර ඇති අතර ඉදිරි හිඟ මුදල් ගෙවා පියවීමට මහා භාණ්ඩාගාරයෙන් ආධාර මුදලක් ඉල්ලා ඇත.	
(උ) 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16 (i) වගන්තිය	දායක මුදල් ඊළඟ එලඹෙන මාසයේ අවසාන දිනට හෝ එදිනට පෙර ගෙවිය යුතු වුව ද , දායක මුදල නියමිත දිනට සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.20,900,575 ක් ගෙවීමට පැවතිණි.	ආයතනය දිගින් දිගටම මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතාවයන් නිසා EPF හා ETF මුදල් කලට වේලාවට ගෙවීමට නොහැකි විය. නමුත් පසුව මෙම හිඟ EPF හා ETF මුදල් වලින් කොටස් ගෙවීමට කටයුතු කර ඇති අතර ඉදිරි හිඟ මුදල් ගෙවා පියවීමට මහා භාණ්ඩාගාරයෙන් ආධාර මුදලක් ඉල්ලා ඇත.	1980 අංක 46 දරණ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව නිසි පරිදි කලට වේලාවට දායක මුදල් ප්‍රේෂණය කළ යුතු ය.
(එ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ			
6.5.1 වගන්තිය	මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 වර්ෂයට අදාළ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 3 මාස 11 ක ප්‍රමාදයක් සහිතව එනම් 2025 ජනවාරි 29 දිනදීය.	මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණන කටයුතුවලට ඉදිරිපත් නොකිරීම නිසා 2021 සිට 2024 දක්වා ගිණුම් විගණනය කළ යුතුව පවතී.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ.
(ඒ) 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය	සංස්ථාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.	මේ සම්බන්ධව ආයතනයේ කටයුතු කරමින් සිටි අතර පසුව සිදුවූ දේශපාලන වෙනස්කම් මත මෙම වැඩසටහන අතරමග නතර වී ඇත.	තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඔ) 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 දරන වත්කම් කළමනාකරණ	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරනු ලබන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය	අදහස් දක්වා නොතිබුණි.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව

චක්‍රලේඛයේ 2 (i) වගන්තිය	නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත් පවරාදීමට කටයුතු කළ යුතු වුවත්, 2016 සහ 2024 කාල සීමාවට අදාලව ධීවර අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත ලබා දී ඇති වාහන 04 ක් වාර්තාවේ දිනවන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.

(ඕ)2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) ඡේද 3.4.3	සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.	කොරෝනා වසංගත තත්වය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය, සේවක පැමිණීම දුර්වලතාවය නිසා නිසි පරිදි සිදු නොවීය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.
(ii) ඡේද 4.2.1	අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කල යුතු නමුත් වාර්තාවේ දින වනවිටත් එම සැලැස්ම සහ ඊට අදාල අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන් ඉදිරිපත් කර නොතිබුණි	2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට කොරෝනා වසංගත තත්වය තුල නොහැකි විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කළ යුතුය.
(iii) ඡේද 4.2.2	සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහන විගණනයට ඉදිරිපත් නොවීය.	කොරෝනා වසංගත තත්වය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය, සේවක පැමිණීම දුර්වලතාවය නිසා නිසි පරිදි සිදු නොවීය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 140,755,130 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 163,479,625 ක් විය. ඒ අනුව ඌණතාවය රු.22,724,495 කින් අඩු වී තිබුණි. මෙම ඌණතාවය අඩු වීමට විකුණුම් පිරිවැය රු. 62,814,236 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු. 12,639,930 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 අනුපාත විශ්ලේෂණය

ප්‍රශස්ත ජංගම අනුපාතය 2:1 ක් විය යුතු වුවත් 2020 වර්ෂයේ සංස්ථාවේ ජංගම අනුපාතය 0.51 ක් වූ අතර ප්‍රශස්ත ක්ෂණික අනුපාතය 1:1 විය යුතු වුවත් සංස්ථාවේ එම අනුපාතය 0.44 ලෙස පෙන්නුම් කිරීම නිසා කෙටිකාලීන වගකීම් පියවීමට නොහැකිවී ඇති බවද නිරීක්ෂණය විය. ද්‍රවශීලතා මිණුමක් වන මුදල් අනුපාතය බිංදුවට ආසන්න අගයක් ගෙන (0.059) තිබුණු බැවින් කෙටිකාලීන වගකීම් ආවරණය කිරීමට සංස්ථාවට හැකියාවක් නොමැති වීමෙන් කාරක ප්‍රාග්ධන ගැටළුව උග්‍ර වී ඇති බවත් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් බැංකු ගිණුම් 65ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර ඉන් ගිණුම් 17 කට අදාළව එදිනට එකතුව රු.48,528,540 ක බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුම් වලට අදාළ අයිරා පොළිය රු.6,032,375 ක් විය.තවද සංස්ථාව සතු බැංකු ගිණුම්වලින් 2025 පෙබරවාරි 27 දින වන විට බැංකු ගිණුම් 42 ක් ගනුදෙනු නොකරන අක්‍රිය ගිණුම් ලෙස හඳුනාගෙන තිබුණි.	ලංකා බැංකුව මඟින් ලබා ගත් කෙටිකාලීන ණය මුදලක් සහ අයිරා පහසුකම් නොපියවීම මත ලංකා බැංකුවේ විවෘත කර ඇති සියළුම ගිණුම් අක්‍රීය කිරීමට ඔවුන් කටයුතු කර ඇත. දැනට මේ සම්බන්ධව ලංකා බැංකු නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී මෙම ගිණුම් යළි සක්‍රීය කිරීමට බලාපොරොත්තු වේ. කෙසේ නමුත් ඉදිරියේදී බැංකු ණය පහසුකම් ලබා ගැනීමට කළමනාකරණය තීරණය කර ඇත.	අයිරා පොලිය නියමිත පරිදි ගෙවීම් කළ යුතු අතර අක්‍රීය බැංකු ගිණුම් සම්බන්ධයෙන් නැවත බැංකුව සමඟ සාකච්ඡා කර නිරවුල් කර ගත යුතු ය.